# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 258 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 12/02/2024<br>පැය 2130 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් නිලධාරියෙකු දියේ ගිලී මියයාමක් - පමුණුගම පොලිස් වසම.**

2024.02.11 වන දින රාත්‍රී කාලයේ පමුණුගම පොලිස් වසමේ උස්වැටකෙයියාව, තල්දියවත්ත, පළමු බේසම අසල මුහුදු තීරයේ දිය නෑමට ගොස් සිටියදී පොලිස් කොස්තාපල්වරයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට පමුණුගම පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කරන ලදී.

**මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 24 ක් වූ කෝට්ටෙගොඩ, බදුල්ල ප්‍රදේශයේ පදිංචි ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට අනුයුක්ත පොලිස් කොස්තාපල් වරයෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට අනුයුක්ත තවත් නිලධාරීන් පිරිසක් සමඟ ඉහත මුහුදු තීරයේ දිය නාමින් සිටියදී මෙම නිලධාරියා දියේ ගිලීමෙන් පසු ප්‍රතිකාර සඳහා පුද්ගලික රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට විමර්ශන වලදී අනාවරණය වී ඇත. රාගම රෝහලේදී පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකර දේහය ඥාතීන්ට භාරදී ඇත. පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**